# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන
# විශේෂ ජනාධිපති පරීක්ෂණ
# කොමිෂන් සභා පනත

[සහතිකය සටහන් කළේ 1978 පෙබරවාරි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 පෙබරවාරි මස 17 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 80 යි                    තැපැල් ගාස්තුව : ශත 20 යි

[සහතිකය සටහන් කළේ 1978 පෙබරවාරි මස 10 වන දින]

එල්.ඩී.—ඕ. 5/78

**විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පිහිටුවීම හැකි කරවීම පිණිස ද එහි සාමාජිකයන් පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඒවායේ බලතල සහ කාර්ය පටිපාටිය නියම කිරීම පිණිස ද ඒවායේ කටයුතු ඉටු කිරීම පහසු කිරීම පිණිස ද ඉහත කී කාරණාවලට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පිහිටුවීම.

2. (1) (අ) යම් රාජ්‍ය ආයතනයක හෝ පළාත් පාලන ආයතනයක පරිපාලනය ;

(ආ) යම් නීතියක් ක්‍රියාවේ යෙදවීම හෝ යුක්තිය පසිඳලීම ;

(ඇ) යම් රාජ්‍ය නිලධරයකුගේ ක්‍රියාකලාපය ; හෝ

(ඈ) යම් කාරණයක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම මහජන යහපත සඳහා ඉවහල් වන බව හෝ මහජන ආරක්ෂාව හෝ සුභසිද්ධිය සඳහා ඉවහල් වන බව ජනාධිපතිවරයාගේ මතය වන විටක, එම කාරණය

සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්වීම සහ තොරතුරු ලබා ගැනීම අවශ්‍ය යයි ජනාධිපතිවරයාට පෙනී යන කවර විටක වුව ද, ජනාධිපතිවරයා විසින් ශ්‍රී ලංකා ජනරජයේ පොදු මුද්‍රාව යටතේ වූ අධිකාර පත්‍රයක් මගින්, එම පරිපාලනය, ක්‍රියාවේ යෙදවීම, යුක්තිය පසිඳලීම, ක්‍රියාකලාපය හෝ කාරණය සම්බන්ධයෙන් පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා, එක් එක් සාමාජිකයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වන වගන්තිය යටතේ ජාතික රාජ්‍ය සභාව විසින් ඇති කරන ලද සහ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ දිසා අධිකරණයට වඩා පහළ නොවන වෙනත් යම් අධිකරණයක හෝ විනිශ්චයකාරවරයකු විය යුතු, අධිකාර පත්‍රයේ සඳහන් වන පරිදි සාමාජිකයකුගෙන් හෝ සාමාජිකයන්ගෙන් සමන්විත වන්නා වූ, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) මේ පනත යටතේ නිකුත් කරනු ලබන සෑම අධිකාර පත්‍රයක ම—

(අ) කොමිෂන් සභාවේ සාමාජිකයාගේ හෝ එක් එක් සාමාජිකයාගේ නම සඳහන් විය යුතු ය ;

(ආ) එක් සාමාජිකයකුට වැඩි සාමාජික සංඛ්‍යාවකින් කොමිෂන් සභාවක් සමන්විත වන අවස්ථාවක, කොමිෂන් සභාවේ සභාපති විය යුතු සාමාජිකයා කවරකු ද යන වග සඳහන් විය යුතු ය ;

(ඇ) කොමිෂන් සභාවේ විෂය කරුණු ඇතුළත් විය යුතුය ;

(ඈ) පරීක්ෂණය හෝ එහි යම් කොටසක් ප්‍රසිද්ධියේ පැවැත් විය යුතු ද නැතහොත් එසේ ප්‍රසිද්ධියේ නොපැවැත් විය යුතු ද යන බවට වූ විධානයක් ඇතුළත් විය යුතු ය ; තව ද

(ඉ) කොමිෂන් සභාවට සුදුසු යයි පෙනී යන අතුරු වාර්තා ද ඇතුළුව, වාර්තා ඉදිරිපත් කරන ලෙසට වූ නියමයක් ඇතුළත් විය යුතු ය.

(3) යම් කොමිෂන් සභාවක පරීක්ෂණ කටයුතු අවසාන කිරීමට පෙර, ඒ කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු විශ්‍රාම ගැනීම සඳහා නීතියෙන් නියමිත විශ්‍රාම ගැනීමේ වයසට එළඹෙන අවස්ථාවක ඒ විශ්‍රාම ගැනීම නොතකා ඒ කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු අවසාන වන තුරු, ඔහු විසින් ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස දිගට ම ධුරය දැරිය යුතු ය.

(4) ජනාධිපතිවරයා විසින්, කොමිෂන් සභාවේ විෂය කරුණු පුළුල් කරුණු වශයෙන් අධිකාර පත්‍රයෙහි සඳහන් කරනු ලැබීම නිත්‍යානුකූල විය යුතු ය ; තව ද පරීක්ෂණයේ විෂය සීමාව නිශ්චය කිරීමට ද කොමිෂන් සභාවේ මතය අනුව, පරීක්ෂා කොට වාර්තා කළ යුතු නිශ්චිත කරුණු තෝරා ගැනීමට ද කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා අධිකාර පත්‍රයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, එම අධිකාර පත්‍රය අවසානාත්මක සහ නිරණාත්මක විය යුතු අතර රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් කිසිම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී එය ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

**අලුත් සාමාජිකයින් පත් කිරීම.**

3. (1) කොමිෂන් සභාවක යම් සාමාජිකයකු මිය ගිය විට හෝ ඉල්ලා අස් වූ විට හෝ සම්පූර්ණ පරීක්ෂණය හෝ එහි යම් කොටසක් වෙනුවෙන් ඔහුගේ කාර්ය ඉටුකිරීමෙන් නිදහස් කරනු ලැබීමට අපේක්ෂා කරන හෝ ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරන හෝ නොහැකිවන අවස්ථාවක ඒ සම්පූර්ණ පරීක්ෂණය හෝ එහි යම් කොටසක් සඳහා අලුත් සාමාජිකයකු ජනාධිපතිවරයා විසින් පත් කළ හැකි ය.

(2) එවැනි පත් කිරීමක් කරනු ලබන තුරු, කොමිෂන් සභාවේ ඉතිරි සාමාජිකයන් ඉදිරිපිට දී පරීක්ෂණය දිගට ම පවත්වනු ලැබිය හැකි අතර එවැනි පත් වීමක් කරනු නොලැබුවහොත්, කොමිෂන් සභාවේ ඉතිරි සාමාජිකයන් ඉදිරිපිට දී පරීක්ෂණය දිගට ම පවත්වා අවසාන කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ අලුත් සාමාජිකයකු පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ පත් කිරීමට පෙරාතුව කොමිෂන් සභාව ඉදිරිපිට දී ගන්නා ලද සාක්ෂි නැවත ගැනීම

අවශ්‍ය නොවිය යුතු අතර ඒ පත් කිරීමට පෙරාතුව පරීක්ෂණ කටයුතු පැවති අවස්ථාවේ සිට ඒ පරීක්ෂණ කටයුතු දිගට ම පවත්වා ගෙන යාමට කොමිෂන් සභාවට හිමිකම් තිබිය යුතු ය:

එසේ වුව ද කොමිෂන් සභාව එක් සාමාජිකයකුගෙන් පමණක් සමන්විත වන අවස්ථාවක, පරීක්ෂණය මුල සිට ආරම්භ කළ යුතු ය.

4. මේ පනත යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රයක් මගින් පිහිටුවන ලද කොමිෂන් සභාවක වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා වූ කාලය ඉකුත් වුව ද නොවුව ද, ඒ අධිකාර පත්‍රයේ තම අත්සන යටතේ පිටසනක් කිරීමෙන් ජනාධිපතිවරයා විසින් ඒ වාර්තාව ඉදිරිපත් කිරීමේ කාලය කලින් කල දීර්ඝ කරනු ලැබිය හැකි ය.

කාලය දීර්ඝ කිරීම.

5. මේ පනත යටතේ නිකුත් කරන ලද යම් අධිකාර පත්‍රයක විෂය කරුණු 3 වන වගන්තියේ හෝ 4 වන වගන්තියේ කාර්ය සඳහා වෙනස් කිරීම, නැත්හොත් ඒ විෂය කරුණු කවර හෝ ආකාරයකින් සංශෝධනය කිරීම හෝ ඒ අධිකාර පත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ ජනාධිපතිවරයා විසින් කවර හෝ අවස්ථාවක කරනු ලැබිය හැකි ය.

අධිකාර පත්‍රය වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම.

6. මේ පනත යටතේ නිකුත් කරන ලද කිසිම අධිකාර පත්‍රයක්, ඒ අධිකාර පත්‍රය නිකුත් කළ ජනාධිපතිවරයාගේ මරණය නිසා හෝ ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ ඉල්ලා අස්වීම නිසා හෝ විශ්‍රාම ගැනීම නිසා හෝ ඉවත් කරනු ලැබීම නිසා හෝ බලරහිත නොවිය යුතු අතර ඒ අධිකාර පත්‍රය කෙරෙහි අන්‍යාකාර බලපෑමක් ද නොවිය යුතු ය.

ජනාධිපතිවරයා වෙනස් වීම.

7. (1) මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවකට පහත දැක්වෙන බලතල තිබිය යුතු ය :—

කොමිෂන් සභාවේ බලතල හා කොමිෂන් සභාවේ ඉල්ලීම මත පවරනු ලැබිය හැකි අතිරේක බලතල.

(අ) ලබා ගැනීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමිෂන් සභාව කල්පනා කරන සියලු ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීම හා භාර ගැනීම සහ ප්‍රශ්න කරනු ලැබීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි කොමිෂන් සභාව කල්පනා කරන සියලු තැනැත්තන්ගෙන් සාක්ෂිකරුවන් ලෙස ප්‍රශ්න කිරීම ;

(ආ) යම් සාක්ෂිකරුවකු අධිකරණයක දී සාක්ෂි දෙන්නේ නම්, ඔහු විසින් කළ යුතු ලෙස නියම කරනු ලැබිය හැකි ආකාරයේ දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් පිට (ලිඛිත හෝ වාචික) සාක්ෂි දෙන ලෙස ඒ සාක්ෂිකරුට නියම කිරීම සහ එවැනි සෑම සාක්ෂිකරුවකු ම ලවා දිවිරීම හෝ සහතික ප්‍රකාශය කරවීම හෝ තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් බලය දෙන ලද නිලධරයකු මගින් ඒ සාක්ෂිකරු ලවා එම දිවිරීම හෝ සහතික ප්‍රකාශය කරවීමට සැලැස්වීම ;

(ඇ) සාක්ෂි දීම සඳහා හෝ තම සන්තකයෙහි තිබෙන යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම සඳහා කොමිෂන් සභාවේ යම් රැස්වීමකට පැමිණ සිටින ලෙස

යම් තැනැත්තකු කැඳවීම සහ සාක්ෂිකරුවකු ලෙස ඔහුගෙන් ප්‍රශ්න කිරීම හෝ ඔහුගේ සන්තකයෙහි තිබෙන යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කිරීම ;

(ඈ) සාක්ෂි ආඥාපනතේ විධිවිධානවල හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවල දී යම් අධිකරණයක දී ආවේශ්‍ය නොකළ හැකි ලිඛිත හෝ වාචික සාක්ෂි කිසිවක් ආවේශ්‍ය කිරීම ;

(ඉ) අධිකාර පත්‍රයෙහි ඇතුළත් යම් විධානයකට යටත්ව—

(i) පරීක්ෂණයට හෝ එහි යම් කොටසකට මහජනයා ඇතුළු කර ගැනීම හෝ පරීක්ෂණයෙන් හෝ එහි යම් කොටසකින් මහජනයා බැහැර කිරීම ;

(ii) පරීක්ෂණයට හෝ එහි යම් කොටසකට පුවත් පත් වාර්තාකරුවන් ඇතුළු කර ගැනීම හෝ පරීක්ෂණයෙන් හෝ එහි යම් කොටසකින් ඔවුන් බැහැර කිරීම ;

(ඊ) යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය මේ පනත යටතේ වූ පරීක්ෂණයෙහි විෂය වන්නේ ද නැතහොත් යම් තැනැත්තකු පරීක්ෂණයට යටත්ව පවත්නා කාරණයට කිසියම් ආකාරයකින් සම්බන්ධ කරනු ලැබ හෝ සම්බන්ධව හෝ සිටී ද ඒ තැනැත්තා විසින් පරීක්ෂණය සම්බන්ධයෙන් ගාස්තු හා වියදම් වශයෙන් යුක්ති සහගතව දරන ලද්දේ යයි කොමිෂන් සභාවේ මතය වන මුදල් ප්‍රමාණයක් ඒ තැනැත්තාට ප්‍රදානය කරනු ලැබිය යුතු යයි නිර්දේශ කිරීම. මේ ඡේදයෙහි " ගාස්තු හා වියදම් " යන්නට නීතිඥවරයකු මාර්ගයෙන් කරුණු ඉදිරිපත් කිරීමේ ගාස්තු ද පරීක්ෂණයට ආනුෂංගික හෝ පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් වූ හෝ ඒ තැනැත්තා පරීක්ෂණයට පැමිණ සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් වූ ගමන් හා වෙනත් වියදම් ද ඇතුළත් වේ.

(2) මේ පනත යටතේ පිහිටුවනු ලැබූ කොමිෂන් සභාවක් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, පහත දැක්වෙන බලතල සියල්ල හෝ ඉන් කිසිවක් හෝ අධිකාර පත්‍රයට කරනු ලබන සංශෝධනයක් මගින් ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත පවරනු ලැබිය හැකි ය :—

(අ) කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය පිළිබඳව පරීක්ෂා කර ගෙන යනු ලබන්නේ ද ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ /භාර්යාවගේ නැතහොත් පුතකුගේ හෝ දුවකගේ හෝ කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලබන වෙනත් යම් තැනැත්තකුගේ හෝ ගිණුමට අදාළ සටහන් ඇතුළත් බැංකුවේ යම් පොතක් හෝ ලේඛනයක් දැන්වීමෙයි සඳහන් පරිදි ඉදිරිපත් කරන

ලෙස නැතහොත් ඒ සටහන්වල සහතික පිටපත්, දැන්වීමෙහි එසේ සඳහන් කර ඇති පරිදි, සපයන ලෙස ශ්‍රී ලංකාවේ යම් බැංකුවක කළමනාකාරවරයාට හෝ එහි යම් නිලධරයකුට හෝ ලිඛිත දැන්වීමක් මගින් නියම කිරීම;

(ආ) කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය පිළිබඳව පරීක්ෂා කර ගෙන යනු ලබන්නේ ද ඒ තැනැත්තාගේ හෝ ඒ තැනැත්තාගේ ස්වාමිපුරුෂයාගේ/භාර්යාවගේ නැතහොත් පුතකුගේ හෝ දුවකගේ හෝ කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලබන වෙනත් යම් තැනැත්තකුගේ හෝ කටයුතුවලට අදාළව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා හෝ විනිමය පාලකවරයා හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් නිලධරයකු හෝ වෙත ඇති සියලු තොරතුරු දැන්වීමෙහි සඳහන් පරිදි සපයන ලෙස සහ ඒ නිලධරයාගේ සන්තකයෙහි හෝ ඔහුගේ පාලනය යටතේ ඇති අවස්ථාවෝචිත පරිදි ඒ තැනැත්තාට, සවාමිපුරුෂයාට /භාර්යාවට, පුතාට හෝ දුවට හෝ වෙනත් තැනැත්තාට අදාළ වන්නා වූ යම් ලේඛනයක් හෝ යම් ලේඛනයක සහතික පිටපතක් හෝ දැන්වීමෙහි සඳහන් කර ඇති පරිදි ඉදිරිපත් කරන ලෙස හෝ සපයන ලෙස ඒ නිලධරයාට ලිඛිත දැන්වීමක් මගින් නියම කිරීම;

(ඇ) කොමිෂන් සභාව අවශ්‍ය යයි සලකන, ලිඛිත නියමයෙහි සඳහන් යම් තැනැත්තකුගේ බැංකුවෙහි වූ යම් ගිණුමක බැරට ඇති යම් මුදල්වලින් කොමිෂන් සභාව විසින් කලින් කල ලියවිල්ලකින් අනුමත කරනු ලබන යම් සාධාරණ ආපසු ගැනීමක් හැර ඒ තැනැත්තාට ඒ බැංකුවෙහි වූ ගිණුමේ බැරට ඇති මුදල්වලින් කිසිවක් ඒ තැනැත්තා විසින් ආපසු ගැනීමට අවසර දීම හෝ ඉඩදීම ශ්‍රී ලංකාවේ යම් බැංකුවක කළමනාකාරවරයාට ලිඛිත නියමයක් මගින් තහනම් කිරීම;

(ඈ) ලිඛිත නියමයෙහි සඳහන් කරනු ලැබිය යුතු වූ සහ කොමිෂන් සභාව ඉදිරියෙහි පැවැත්වෙන යම් පරීක්ෂණයක දී සාක්ෂි දීම හෝ පැමිණ සිටීම හෝ අවශ්‍ය විය හැකි තැනැත්තකු වූ යම් තැනැත්තකුගේ ගමන් බලපත්‍රය සහ වෙනත් ගමන් ලේඛන පරිරෝධ කිරීමට ආගමන හා විගමන පාලකවරයා වෙත ලිඛිත නියමයක් මගින් කරනු ලැබූ නියමය, ඔහු වෙත කරනු ලැබූ යම් තදනන්තර ලිඛිත නියමයක් වේ නම් ඒ නියමය මගින් කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක්, එසේ පරිරෝධ කරන ලෙස ලිඛිත නියමයක් මගින් ඔහු වෙත නියම කිරීම;

(ඉ) ලිඛිත නියමයෙහි සඳහන් කරනු ලැබිය යුතු වූ සහ කොමිෂන් සභාව ඉදිරියෙහි පැවැත්වෙන යම් පරීක්ෂණයක දී සාක්ෂි දීම හෝ පැමිණ සිටීම හෝ අවශ්‍ය විය හැකි තැනැත්තකු වූ යම් තැනැත්තකු ශ්‍රී ලංකාවෙන් බැහැර යාම වැළැක්වීම සඳහා අවශ්‍ය සියලු පියවර ගන්නා ලෙස ලිඛිත නියම

යෙහි නමින් හෝ නිලයෙන් සඳහන් පොලිස් නිලධරයකු වෙත ලිඛිත නියමයක් මගින් කරනු ලැබූ නියමය, ඔහු වෙත කරනු ලැබූ යම් තදනන්තර ලිඛිත නියමයක් වේ නම් ඒ නියමය මගින් කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක්, එසේ සියලු පියවර ගන්නා ලෙස ලිඛිත නියමයක් මගින් ඔහු වෙත නියම කිරීම ;

(ඊ) ලිඛිත නියමයෙහි නමින් හෝ නිලයෙන් සඳහන් කරනු ලැබිය යුතු (විදුලි සංදේශ ආඥාපනතේ අර්ථානුකූලව) විදුලි සංදේශ බලධරයකු විසින් හෝ නිලධරයකු විසින්, කොමිෂන් සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන්නා වූ ද, ඒ බලධරයාගේ හෝ නිලධරයාගේ සන්තකයේ හෝ ඔහුගේ බලය යටතේ තිබෙන්නා වූ ද යම් ටෙලෙක්ස් පණිවුඩ ඇතුළුව (ඒ ආඥාපනතේ අර්ථානුකූලව) යම් පණිවුඩයකට අදාළ සටහන් ඇතුළත් යම් පොතක් හෝ ලේඛනයක් එසේ සඳහන් පරිදි ඉදිරිපත් කළ යුතු යයි හෝ එම සටහන්වල සහතික පිටපත් එසේ සඳහන් පරිදි ඉදිරිපත් කළ යුතු යයි ලිඛිත නියමයක් මගින් ඔහු වෙත නියම කිරීම.

(3) කොමිෂන් සභාවේ විෂය කරුණුවල විෂය පථයට ඇතුළත් වූ සහ නිශ්චිත වශයෙන් සඳහන් වී තිබෙන හෝ එසේ සඳහන් වී නොතිබෙන කාරණාවලට අදාළ කාරණා පිළිබඳව මහජනයාගෙන් නියෝජන කැඳවීමට ද එවැනි යම් නියෝජනයක් පිළිබඳව පරීක්ෂා කිරීමට සහ වාර්තා කිරීමට ද කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

(4) මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවක් විසින් (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාව වෙත පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කළ හැකි ය. තව ද ඒ බලය ක්‍රියාත්මක කිරීමේ දී කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට විධානයක් නිකුත් කරනු ලබන්නේ ද ඒ තැනැත්තා විසින්, වෙනත් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, එම විධානය ක්‍රියාත්මක කළ යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රාජ්‍ය නිලධරයන් විය යුතු බව සහ පරීක්ෂණ "අධිකරණ කටයුතු" විය යුතු බව.

8. කොමිෂන් සභාවක සාමාජිකයන්, ඔවුන් එහි සාමාජිකයන් වශයෙන් ක්‍රියා කරන තාක් කල්, දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ සෑම පරීක්ෂණයක් ම ඒ සංග්‍රහයෙහි අර්ථානුකූලව අධිකරණ කටයුත්තක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

පුරවැසි අශක්තතා නියම කිරීම.

9. (1) යම් අධිකරණයකට, විනිශ්චය අධිකාරයකට හෝ රාජ්‍ය ආයතනයකට අදාළව හෝ යම් නීතියක් ක්‍රියාත්මක කිරීමට හෝ යුක්තිය පසිඳලීමට අදාළව දේශපාලන වශයෙන් පළිගැනීමේ, බලය අනිසි ලෙස පාවිච්චි කිරීමේ හෝ බලය අයථා ලෙස පාවිච්චි කිරීමේ යම් ක්‍රියාවක් හෝ යම් දූෂණ ක්‍රියාවක් හෝ යම් වංචනික ක්‍රියාවක් පිළිබඳව යම් තැනැත්තකු වරදකරුවකු වන බව කොමිෂන් සභාවක් විසින් පරීක්ෂණයේ දී තීන්දු කරන ලද සහ ඒ ගැන

ජනාධිපතිවරයා වෙත වාර්තා කරන ලද අවස්ථාවක, එම තැනැත්තා යම් ප්‍රජා අශක්නුතාවකට යටත් කළ යුතු දැයි කොමිෂන් සභාව විසින් නිර්දේශ කළ යුතු අතර හැකි ඉක්මණින් එම තීන්දුව ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට ජනාධිපතිවරයා විසින් සැලැස්විය යුතු අතර එම වාර්තාව පළ කරනු ලැබීමට ද විධාන කළ යුතු ය.

(2) මේ පනත යටතේ කොමිෂන් සභාවක් විසින් කරන ලද යම් වාර්තාවක්, තීන්දුවක්, නියමයක්, නිශ්චය කිරීමක්, තීරණයක් හෝ නිර්දේශයක් අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ යම් අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී ඒ පිළිබඳව ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා, ප්‍රජා අශක්නුතාව යන්නෙන් යම් තැනැත්තකු—

(i) ජනරජයේ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා වූ යම් ඡන්ද විමසීමක දී හෝ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීම සඳහා වූ හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු තෝරා පත් කර ගැනීම සඳහා වූ යම් ඡන්ද විමසීමක දී ඡන්ද හිමියකු වීමට හා ඡන්දය දීමට;

(ii) එවැනි යම් ඡන්ද විමසීමක දී අපේක්ෂකයකු වශයෙන් නාම යෝජනා කරනු ලැබීමට;

(iii) ජනරජයේ ජනාධිපතිවරයා ලෙස තෝරා පත් කර ගනු ලැබීමට හෝ පත් කරනු ලැබීමට හෝ ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු ලෙස හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු ලෙස තෝරා පත් කර ගනු ලැබීමට සහ එවැනි මන්ත්‍රීවරයකු හෝ සභිකයකු ලෙස ක්‍රියා කිරීමට හා ඡන්දය දීමට; සහ

(iv) රාජ්‍ය නිලධරයකු වශයෙන් ධුර දැරීමට හෝ රාජ්‍ය නිලධරයකු වශයෙන් සේවයෙහි නියුක්ත කරනු ලැබීමට

නුසුදුසු වීම අදහස් වේ.

අපහාස කිරීම සම්බන්ධයෙන් දඩුවම.

10. (1) මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවක අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන සෑම අපහාස වරදක් ම සම්බන්ධයෙන්, ඒ වරද ශ්‍රේෂ්ඨාධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි සිදු කරන අපහාස වරදක් වූවාක් මෙන්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 41 වන වගන්තිය යටතේ හෝ ඊට ආදේශ වශයෙන් පනවනු ලබන වෙනත් යම් විධිවිධානයක් යටතේ හෝ දඬුවම් කරනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව සම්බන්ධයෙන්, කොමිෂන් සභාව ඉදිරිපිට දී හෝ අන්‍යාකාරයකින් හෝ කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක්, ඒ කරන ලද හෝ නොකර හරින ලද ක්‍රියාව ශ්‍රේෂ්ඨාධිකරණය සම්බන්ධයෙන් කරන ලද නම් හෝ නොකර

හරින ලද නම්, ඉන් එම අධිකරණයේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සංයුක්ත වන්නේ නම්, කරන ලද හෝ නොකර හරින ලද ඒ ක්‍රියාවෙන් ඒ කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සංයුක්ත වන්නේ ය.

(3) (අ) යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් සිදු කර ඇති බවට කොමිෂන් සභාවක් විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක, ඒ නිශ්චය කිරීම දක්වෙන සහතිකයක් කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවීමට කොමිෂන් සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය; එවැනි සෑම සහතිකයක් ම කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ කොමිෂන් සභාව එක් තැනැත්තකුගෙන් පමණක් සමන්විත වන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් හෝ අත්සන් කරනු ලැබිය යුතු ය.

(ආ) මේ වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි සැලකිල්ලට ගැනීම සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය කල්පනා කරන අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා වූ යම් නඩු කටයුතුවල දී, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ අත්සන් කරන ලද සහ අධිකරණය වෙත යවන ලද සහතිකයක් යයි කියනු ලබන යම් ලේඛනයක්—

(i) සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, වැඩිදුර ඔප්පු කිරීමක් නොමැතිව එය එසේ වූ සහතිකයක් ලෙස සල කනු ලැබිය යුතු ය; තව ද

(ii) සහතිකයේ දැක්වෙන නිශ්චය කිරීම කොමිෂන් සභාව විසින් කරන ලද බවට සහ නිශ්චය කිරීමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂ්‍ය විය යුතු ය.

(ඇ) යම් කොමිෂන් සභාවක අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි වූ අපහාස වරදක් යයි කියනු ලබන යම් වර දක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම පිණිස මේ වගන්තියෙන් විධි විධාන සලස්වා ඇති පරිදි පවත්වනු ලබන යම් නඩු කටයුතුවල දී කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයකු, ඔහුගේ කැමැත්ත ඇතිව හැර, සාක්ෂිකරුවකු වශයෙන් කැඳවීම හෝ ඔහුගෙන් ප්‍රශ්න කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

සිතාසි.

11. (1) යම් කොමිෂන් සභාවක් එක් සාමාජිකයකුගෙන් පමණක් සමන්විත වන කවර හෝ අවස්ථාවක සෑම සිතාසියක් ම එම සාමාජිකයාගේ අත්සන යටතේ විය යුතු අතර යම් කොමිෂන් සභාවක් එක් සාමාජිකයකුට වැඩි සාමාජික සංඛ්‍යාවකින් සමන්විත වන අවස්ථාවක, සෑම සිතාසියක් ම කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ අත්සන යටතේ විය යුතු ය:

එසේ වුව ද, ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීමට 10 වන වගන්තිය යටතේ යම් තැනැත්තකු පත් කරන ලද අවස්ථාවක, එවැනි යම් සිතාසියක් කොමිෂන් සභාවේ අවසරය ඇතිව, එම ලේකම්වරයාගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) යම් සිතාසියක්, එහි නම් සඳහන් තැනැත්තා වෙත ගෙන ගොස් භාර දීමෙන් හෝ එසේ කිරීම කළ නොහැකි නම්, එය ඒ තැනැත්තාගේ අන්තිමට දන්න සිටි වාසස්ථානයෙහි තැබීමෙන් හෝ භාර දෙනු ලැබිය හැකි ය.

(3) සිතාසියක් භාර දෙනු ලැබූ සෑම තැනැත්තකු ම, ඒ සිතාසියෙහි සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියෙහි පෙනී සිටිය යුතු අතර, ඔහු විසින් සිතාසියේ භාවය අනුව සාක්ෂි දීම හෝ ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කරනු ලැබ තිබෙන්නා වූ ද, ඔහුගේ සන්තකයේ හෝ බලය යටතේ ඇත්තා වූ ද ලේඛන හෝ වෙනත් දේ ඉදිරිපත් කිරීම හෝ කළ යුතු ය.

(4) මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද යම් සිතාසියක් අනුව කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම හෝ ඉදිරිපත් කරන ලෙස එවැනි යම් සිතාසියක් මගින් නියම කරනු ලබන යම් ලේඛනයක් හෝ දෙයක් ඉදිරිපත් කිරීම හෝ යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබුවහොත්, ඒ තැනැත්තා සිරභාරයට ගනු ලැබීමට යටත් විය යුතු අතර, එසේ සිරභාරයට ගනු ලැබූ විට, ඔහු වහාම කොමිෂන් සභාව ඉදිරියට පමුණුවනු ලැබිය යුතු ය. තව ද කොමිෂන් සභාව විසින් ඒ තැනැත්තා, කොළඹ අධිකරණ කලාපයෙහි හෝ වෙනත් යම් පහසු කලාපයක මුල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන ඉහළ ම අධිකරණයේ පිස්කල්වරයාගේ අත් අඩංගුවේ රිමාන්ඩ් කර තබන ලෙස නියම කිරීම හෝ කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් නියම මත මුදා හරින ලෙස නියම කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

12. (1) මේ පනත යටතේ සිතාසියක් භාර දෙනු ලැබූ යම් තැනැත්තකු විසින්— සාක්ෂිදීම ආදිය සඳහා වූ සිතාසිවලට අවනතවීම පැහැර හැරීම.

(අ) සිතාසියෙහි සඳහන් වේලාවේ දී සහ ස්ථානයේ දී කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම, කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව පැහැර හරිනු ලැබුවහොත් ; හෝ

(ආ) කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව දිවුරීම හෝ ප්‍රතිඥාදීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ නිසි පරිදි දිවුරා හෝ ප්‍රතිඥා දෙනු ලැබ, කොමිෂන් සභාව විසින් පරීක්ෂා කළ යුතු යයි විධාන කරනු ලැබූ කාරණා හා සම්බන්ධ තමා වෙත ඉදිරිපත් කරනු ලැබූ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත් ; හෝ

(ඇ) කොමිෂන් සභාවේ මතය අනුව, පරීක්ෂා කළ යුතු කාරණාවල සත්‍යතාවය නිගමනය කිරීම සඳහා අවශ්‍ය වූ ද තම සන්තකයේ හෝ බලය යටතේ ඇත්තා වූ ද යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් කොමිෂන් සභාවේ මතය අනුව සාධාරණ වන හේතුවක් නොමැතිව කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීම සහ පෙන්වීම, ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත් හෝ පැහැර හරිනු ලැබුවහොත්,

ඒ තැනැත්තා කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි අපහාස වරදක් කිරීමේ වරදට වරදකරු වන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවේ අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි (1) වන උපවගන්තිය යටතේ යම් අපහාස වරදක් සිදුකර ඇති බවට කොමිෂන් සභාවක් විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක ඒ නිශ්චය කිරීම දැක්වෙන සහතිකයක්, කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යැවීමට කොමිෂන් සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය; එවැනි සෑම සහතිකයක් ම කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් හෝ කොමිෂන් සභාව එක් තැනැත්තකුගෙන් පමණක් සමන්විත වන විටක ඒ තැනැත්තා විසින් හෝ අත්සන් කරනු ලැබිය යුතු ය.

(3) 10 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි සැලකිල්ලට ගැනීම සුදුසු යයි ශ්‍රේෂ්ඨාධිකරණය කල්පනා කරන අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම සඳහා වූ යම් නඩු කටයුතුවල දී (2) වන උපවගන්තිය යටතේ අත්සන් කරන ලද සහ අධිකරණය වෙත යවන ලද සහතිකයක් යයි කියනු ලබන යම් ලේඛනයක්—

(අ) සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස, වැඩිදුර ඔප්පු කිරීමක් නොමැතිව එය එසේ වූ සහතිකයක් ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද

(ආ) සහතිකයේ දැක්වෙන නිශ්චය කිරීම කොමිෂන් සභාව විසින් කරන ලද බවට සහ නිශ්චය කිරීමේ සඳහන් කරුණු සම්බන්ධයෙන් තීරණාත්මක සාක්ෂ්‍ය විය යුතු ය.

(4) යම් කොමිෂන් සභාවක අධිකාරයට විරුද්ධව හෝ ඊට අගෞරව වන පරිදි වූ වරදක් යයි කියනු ලබන යම් අපහාස වරදක් සම්බන්ධයෙන් දඬුවම් කිරීම පිණිස 10 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි පවත්වනු ලබන යම් නඩු කටයුතුවල දී කොමිෂන් සභාවේ කිසිම සාමාජිකයකු, ඔහුගේ කැමැත්ත ඇතිව හැර, සාක්ෂිකරුවකු වශයෙන් කැඳවීම හෝ ඔහුගෙන් ප්‍රශ්න කිරීම හෝ කරනු නොලැබිය යුතු ය.

සාක්ෂිකරුවන්ගේ වරප්‍රසාද.

13. මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවක් ඉදිරියෙහි සාක්ෂි දෙන සෑම තැනැත්තකුට ම, සාක්ෂි සම්බන්ධයෙන්, අධිකරණයක් ඉදිරියේ සාක්ෂි දෙන සාක්ෂිකරුවකුට තමා විසින් එම අධිකරණය ඉදිරියේ දෙන ලද සාක්ෂි සම්බන්ධයෙන් හිමි විය යුතු සියලු ම වරප්‍රසාද හිමි විය යුතු ය.

සාක්ෂිකරුවන් සඳහා විශේෂ පරිහාර.

14. කොමිෂන් සභාවක් පිහිටුවීම පිළිබඳ අධිකාර පත්‍රයෙහි හෝ තදනන්තර නියමයක් මගින් හෝ එම කොමිෂන් සභාව සම්බන්ධයෙන් මේ වගන්තිය අදාළ විය යුතු යයි ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලබන අවස්ථාවක, පහත දැක්වෙන විධිවිධාන බලපැවැත්විය යුතු ය.

එනම් :—

(අ) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව, කිසිම තැනැත්තකු, ඒ තැනැත්තා විසින් පරීක්ෂණයේ දී කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව ඉදිරියේ ලිඛිතව හෝ වාචිකව දෙන ලද යම් සාක්ෂියක් සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ අධිකරණයක දී, නඩුවකට, අපරාධ නඩුවකට හෝ වෙනත් නඩු කටයුතුවලට යටත් නොවිය යුතු ය.

(ආ) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ කාර්යය සඳහා, යම් තැනැත්තකු විසින් කොමිෂන් සභාවට හෝ කොමිෂන් සභාව ඉදිරියේ කරන ලද හෝ දෙන ලද යම් ප්‍රකාශයක් පිළිබඳ වූ කිසිම සාක්ෂියක්, යම් සිවිල් හෝ අපරාධ අධිකරණයක යම් නඩුවක දී, අපරාධ නඩුවක දී හෝ වෙනත් නඩු කටයුතුවල දී එම තැනැත්තාට විරුද්ධව ආවේශ්‍ය නොකළ යුතු ය :

එසේ වුව ද ඉහතින් වූ ඡේදවල කිසිවකින්—

(i) මේ පනතේ 8 වන වගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු යම් නඩු පැවරීමකට හෝ දණ්ඩනයකට යටත් වීම ඌනය නොවිය යුතු ය ; නැතහොත් ඒ යටත්වීම කෙරෙහි බලනොපෑ යුතු ය ; නැතහොත් ඒ යටත් වීම ඌනය වේ යයි හෝ ඒ කෙරෙහි බලපාන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ වන්නේ යයි තේරුම් නොගත යුතු ය ; නැතහොත්

(ii) දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් යම් සාක්ෂිකරුවකුට නඩු පැවරීමේ කාර්යය සඳහා, පරීක්ෂණයේ දී සාක්ෂි දෙන්නා වූ ඒ සාක්ෂිකරුගේ නාම හෝ සාක්ෂිය හෝ සාක්ෂියෙහි යම් කොටසක් හෝ පළ කිරීම හෝ අනාවරණය කිරීම තහනම් කරනු නොලැබිය යුතු ය ; නැතහොත් ඒ පළ කිරීම හෝ අනාවරණය කිරීම තහනම් කරනු ලබන්නේ යයි සලකනු නොලැබිය යුතු ය ; නැතහොත් එසේ වන්නේ යයි තේරුම් නොගත යුතු ය.

සාක්ෂිකරුවන් විසින් දෙන ලද සාක්ෂි පිළිබඳ වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ විට පූර්ව නිගමනය.

15. සාක්ෂි ආඥාපනතේ 80 වන වගන්තියෙහි සඳහන් වන ලේඛනවලට ඒ වගන්තිය යටතේ අදාළ වන්නා වූ පූර්ව නිගමන, යම් අධිකරණයක් ඉදිරියෙහි ඉදිරිපත් කරන ලද්දා වූ ද මේ පනත යටතේ පිහිටුවනු ලැබූ කොමිෂන් සභාවක් ඉදිරියෙහි විභාග කරන ලද සාක්ෂිකරුවකු විසින් දෙන ලද සාක්ෂියක් පිළිබඳ හෝ ඒ සාක්ෂියෙහි යම් කොටසක් පිළිබඳ වාර්තාවක් යයි හෝ සංදේශයක් යයි කියනු ලබන්නා වූ හා කොමිෂන් සභාවේ සාමාජිකයන් විසින් අත්සන් කරනු ලැබුවේ යයි කියනු ලබන්නා වූ ද සෑම ලේඛනයකට ම අදාළ විය යුතු ය.

නීතිඥවරයන් විසින් තැනැත්තන් නියෝජනය කරනු ලැබීම.

16. මේ පනත යටතේ යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය පරීක්ෂණයකට විෂය වන්නේ ද එවැනි තැනැත්තකු වශයෙන් හෝ පරීක්ෂණයට යටත් කාරණය පිළිබඳව යම් ආකාරයකින් සම්බන්ධ කරනු ලැබූ හෝ සම්බන්ධව සිටින්නා වූ තැනැත්තකු වශයෙන් සහ කොමිෂන් සභාවේ මතය අනුව පරීක්ෂණයට විෂය විය යුතු වන්නේ යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් ද එවැනි යම් තැනැත්තකු හෝ පරීක්ෂණයට යටත් කාරණය පිළිබඳව කොමිෂන් සභාවේ මතය අනුව යම් ආකාරයකින් සම්බන්ධ කරනු ලැබූ හෝ සම්බන්ධව සිටින්නා වූ, මේ පනත යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රයක සඳහන් සෑම තැනැත්තකුට ම, කොමිෂන් සභාව විසින් ඒ බව දැනුම් දෙනු ලැබිය යුතු අතර, එසේ ඔහුට දැනුම් දීමෙන් පසුව පරීක්ෂණයට අදාළ වන පරිදි පරීක්ෂණයේ යම් අවස්ථාවක එක් නීතිඥවරයකු විසින් හෝ නීතිඥවරයන් වැඩි ගණනක් විසින් නියෝජනය කරනු ලැබීමට ඔහුට හිමිකම ලැබිය යුතු ය ; තව ද තමා එසේ නියෝජනය කරනු ලැබීම යෝග්‍ය යයි අදහස් කරනු ලබන වෙන යම් තැනැත්තකු ද කොමිෂන් සභාවේ අවසරය ඇතිව ඉහත කී ආකාරයෙන් නියෝජනය කරනු ලැබිය හැකි ය.

ගාස්තු සහ වෙනත් වියදම්.

17. (1) මේ පනත යටතේ වූ යම් පරීක්ෂණයක් අවසන් වූ විට සහ කොමිෂන් සභාව විසින් නිර්දේශයක් කරන ලද විට, එම පරීක්ෂණයට විෂය වූයේ යම් තැනැත්තකුගේ ක්‍රියා කලාපය ද, ඒ තැනැත්තාට හෝ පරීක්ෂණය කරනු ලැබූ කාරණයට යම් ආකාරයකින් සම්බන්ධ කර ගනු ලැබූ හෝ සම්බන්ධ වූ යම් තැනැත්තකුට හෝ 7 (1) (අ) වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා කොමිෂන් සභාව විසින් එම පරීක්ෂණය සම්බන්ධයෙන් නිකුත් කරන ලද දැන්වීමකට අනුකූලව ක්‍රියා කර ඇති යම් බැංකු කළමනාකරුවකුට, අමාත්‍යවරයා විසින් ඔහුගේ අත්සන යටතේ වූ නියමයකින්, එම පරීක්ෂණය සම්බන්ධයෙන් එම තැනැත්තා විසින් හෝ බැංකුව විසින් සාධාරණ ලෙස දරනු ලැබූ ගාස්තු සහ වියදම් පියවීමට ප්‍රමාණවත් යයි තම අභිමතය අනුව අමාත්‍යවරයා විසින් එම නියමයෙහි සඳහන් කරනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

මේ උපවගන්තියෙහි "ගාස්තු සහ වියදම්" යන්නට නීතිඥවරයකු විසින් නියෝජනය කිරීමේ ගාස්තු සහ පරීක්ෂණයට ආනුෂංගික වූ හෝ එම තැනැත්තා පරීක්ෂණයට පැමිණ සිටීමේ ප්‍රතිඵලයක් වශයෙන් වූ ගමන් වියදම් සහ වෙනත් වියදම් ඇතුළත් වන

අතර, බැංකුවක් සම්බන්ධයෙන් වන විට ඉහත සඳහන් දූන්වීම අනුව ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වූ ලිපිකරු වියදම්, ගමන් වියදම් සහ වෙනත් වියදම් ද ඊට ඇතුළත් වේ.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයාගේ නියමයකින් ප්‍රදානය කරන ලද සියලු මුදල් ඒකාබද්ධ අරමුදල කෙරෙහි වැය බරක් විය යුතු ය; තව ද එවැනි සියලු මුදල් ගෙවීමට මෙයින් බලය දෙනු ලැබේ.

18. කොමිෂන් සභාවක යම් සාමාජිකයකු විසින් එම කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය. *(කොමිෂන් සභාවේ සාමාජිකයන් ආරක්ෂා කිරීම.)*

19. (1) කොමිෂන් සභාවක ලේකම්වරයා වශයෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර, ජනාධිපතිවරයා විසින් කරනු ලබන යම් විධාන වෙතොත් ඒ විධානවලට යටත්ව, ඒ තැනැත්තා විසින් පරීක්ෂණය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන කාර්ය ඉටු කළ යුතු ය. *(ලේකම්වරයා සහ භාෂණ පරිවර්තකයන් පත් කිරීම.)*

(2) පරීක්ෂණයේ දී උද්ගත වන යම් කාරණයක දී භාෂණ පරිවර්තකයකු වශයෙන් ක්‍රියා කිරීමට සහ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරන ලද යම් පොතක්, ලේඛනයක් හෝ වෙනත් ලියවිල්ලක් පරිවර්තනය කිරීමට යම් තැනැත්තකු කොමිෂන් සභාවක් විසින් පත් කරනු ලැබිය හැකි ය.

20. මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවක් විසින් හෝ එහි බලය පිට හෝ නිකුත් කරන ලද යම් කැඳවීම් නියෝගයක් සඳහා කිසිම මුද්දර ගාස්තුවක් නියම නොවන්නේ ය; නැතහොත් ගෙවිය යුතු නොවන්නේ ය. *(මේ පනත යටතේ නිකුත් කරන ලද කැඳවීම් නියෝගයක් මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතු බව.)*

21. මේ පනත යටතේ පිහිටුවන ලද කොමිෂන් සභාවක් විසින් නිකුත් කරන ලද සෑම කැඳවීම් නියෝගයක් ම භාර දීම සහ ක්‍රියාවේ යෙදවීම පිස්කල්වරයා විසින් හෝ කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් හෝ කළ යුතු ය. *(කැඳවීම් නියෝග භාර දීම.)*

22. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ— *(අර්ථ නිරූපණය.)*

"කොමිෂන් සභාව" යන්නෙන් මේ පනත යටතේ පිහිටුවනු ලබන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් අදහස් වේ;

"යම් රාජ්‍ය නිලධරයකුගේ ක්‍රියා කලාපය" යන්නට—

(i) යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් හෝ යම් රාජ්‍ය ආයතනයක් සම්බන්ධයෙන් වන විට;

(ii) යම් නීතියක් ක්‍රියාත්මක කිරීම හෝ යුක්තිය පසිඳලීම සම්බන්ධයෙන් වන විට

යම් රාජ්‍ය නිලධරයකුගේ ක්‍රියා කලාපය ඇතුළත් වන අතර, ඊට කොමිෂන් සභාව පිහිටුවීම සඳහා නිකුත් කරන ලද අධිකාර පත්‍රයෙහි ජනාධිපතිවරයා විසින් සඳහන් කරන ලද හෝ යම් තැනැත්තකු විසින් එම කොමිෂන් සභාව වෙත කරන ලද යම් රාජ්‍ය නිලධරයකු විසින් බලය අනිසි ලෙස පාවිච්චි කරනු ලැබීම හෝ බලය අයථා ලෙස පාවිච්චි කරනු ලැබීම, දූෂණය සහ දේශපාලන පළිගැනීම් පිළිබඳ චෝදනා ද ඇතුළත් වේ ;

"නීතිය" යන්නට ජාතික රාජ්‍ය සභාවේ යම් පනතක්, පාර්ලිමේන්තු පනතක්, ආඥාපනතක් සහ ජාතික රාජ්‍ය සභාවේ යම් පනතක්, පාර්ලිමේන්තු පනතක් හෝ ආඥාපනතක් යටතේ කරන ලද නියෝජිත නීති හෝ අනු නීති ඇතුළත් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ ;

"රාජ්‍ය ආයතනය" යන්නට—

(i) යම් අමාත්‍යාංශයක් සහ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් ;

(ii) යම් රාජ්‍ය සංස්ථාවක්, කොමිෂන් සභාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් ;

(iii) යම් රාජ්‍ය අධිකාරයක් හෝ පළාත් පාලන ආයතනයක් ;

(iv) කොමිෂන් සභාවේ විෂය කරුණුවල සඳහන් කාල සීමාව ඇතුළත යම් වේලාවක ආණ්ඩුව වෙත සතු කරන ලද හෝ සම්පූර්ණයෙන් ම හෝ ප්‍රධාන වශයෙන් ආණ්ඩුවට අයිති වූ හෝ ආණ්ඩුව වෙනුවෙන් අයිතිව තිබූ යම් වෙළෙඳ ව්‍යාපාරයක්, ව්‍යාපාරික ආයතනයක්, සමාගමක් හෝ වෙනත් ආයතනයක් ;

(v) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 25 දරන ජනාවාස පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ ලියාපදිංචි කරන ලද ලෙස සලකනු ලබන යම් සමිතියක් ; සහ

(vi) සමාන ස්වභාවයකින් යුක්ත වෙනත් යම් මණ්ඩලයක් හෝ ආයතනයක්

ඇතුළත් වේ ;

"රාජ්‍ය නිලධරයා" යන්නට—

(i) ජාතික රාජ්‍ය සභාවේ යම් අමාත්‍යවරයකු, නියෝජ්‍ය අමාත්‍යවරයකු හෝ මන්ත්‍රීවරයකු ;

(ii) යම් රාජ්‍ය නිලධරයකු ; සහ

(iii) යම් රාජ්‍ය ආයතනයක යම් සභාපතිවරයකු, අධ්‍යක්ෂවරයකු, සාමාජිකයකු, නිලධරයකු හෝ කවර හෝ නිල නාමයකින් හඳුන්වනු ලබන සේවා නියුක්තයකු

ඇතුළත් වන අතර, ඊට කොමිෂන් සභාවේ විෂය කරුණුවල සඳහන් කාලසීමාව ඇතුළත් යම් වේලාවක දී රාජ්‍ය නිලධරයකු වූ යම් තැනැත්තෙක් ද ඇතුළත් වේ;

"වාර්තාව" යන්නට අතුරු වාර්තාවක් ද ඇතුළත් වේ.